# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,404 - 2024 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 912 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 920 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ඔක්තෝබර් 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ඔක්තෝබර් 04 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

911 - B 82614— 5,403 (2024/09)

# පළාත් පාලන නිවේදන

## බියගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්ති ප්‍රකාරව පහත විස්තර සඳහන් කර ඇති මාර්ගය "පියසීලි හේමලතා මාවත" ලෙස නම් කිරීම සඳහා බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පහත පරිදි නම් කරනු ලැබ ඇති බැව් නිවේදනය කරනු ලැබේ.

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බියගම ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 06 වැනි දින,
බිගම ප්‍රාදේශීය සභාවේ දී ය.

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | බියගම ප්‍රාදේශීය සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | ගම්පහ |
| 03. | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | 275/බී, හෙයියන්තුඩුව නැගෙනහිර |
| 04. | දැනට භාවිතා වන නම | : | දෙවන පටුමග |
| 05. | අලුතින් යොදා ඇති නම | : | පියසීලි හේමලතා මාවත |
| 06. | මාර්ගයේ ආරම්භය | : | 747/1/ A, නිවස දරන දේපළ |
| 07. | මාර්ගයේ අවසානය | : | 747/1/ D, නිවස දරන දේපළ |

09-186

---

## බියගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්ති ප්‍රකාරව පහත විස්තර සඳහන් කර ඇති මාර්ගය "2 වන පටුමග" ලෙස නම් කිරීම සඳහා බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පහත පරිදි නම් කරනු ලැබ ඇති බැව් නිවේදනය කරනු ලැබේ.

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බියගම ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 06 වැනි දින,
බිගම ප්‍රාදේශීය සභාවේ දී ය.

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | බියගම ප්‍රාදේශීය සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | ගම්පහ |
| 03. | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | මාකොළ උතුර |
| 04. | දැනට භාවිතා වන නම | : | 2 වන පටුමග |
| 05. | අලුතින් යොදා ඇති නම | : | 2 වන පටුමග |
| 06. | මාර්ගයේ ආරම්භය | : | 220/1, නිවස දරන දේපළ |
| 07. | මාර්ගයේ අවසානය | : | 220/1/2, නිවස දරන දේපළ |

09-187

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු, වයඹ පළාත් ආණ්ඩුකාරතුමන් විසින් 2020.10.29 දින අංක 2199/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10(2) ප්‍රකාරව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය 2024.09.30 දින සිට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී, කාර්යාලීය වේලාව තුළ මහජනතාවට පරීක්ෂා කර බැලීමට ඉඩ කඩ සලසා ඇති බව මෙයින් දැනුම් දෙමි

කේ. ආර්. පී. ජී. ආර්. කරුණානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නාත්තන්ඩිය.

2024 සැප්තැම්බර් මස 10 වැනි දින,
නාත්තන්ඩිය, ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-193

---

## කෑගල්ල මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනත යටතේ විරෝධතා කැඳවීම

මෙහි පහත උපලේඛනයෙ හි නම සඳහන් තැනැත්තා විසින්, එහි ඔහුගේ නම ඉදිරියෙන් දක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2025 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව පවත්වාගෙන යාම සඳහා යම් පාර්ශවයක්, යම් ආයතනයක් විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරෝධතාවයට හේතුව ලියවිල්ලක් මගින් දක්වමින්, පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

නාගරික කොමසාරිස්,
බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කෑගල්ල මහා නගර සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
කෑගල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම්* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| විදාන හේනයලාගේ සිරිල්,<br>අංක 167/28,<br>ඔලගම, කෑගල්ල | සභාපති | බ්ලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් | අංක 152,<br>කළුගල්ල, කෑගල්ල |

09-197

## පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට යෝජිත වරිපනම් බදු ලේඛනය පරීක්ෂාව

පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා යෝජිත වරිපනම් බදු ලේඛනය 2024.09.27 දින සිට 2024.10.27 දින දක්වා (සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින හැර) කාර්යාල වේලාවන් තුළ පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජන පරීක්ෂාව පිණිස තබා ඇති බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 141(1) වගන්ති ප්‍රකාරව මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටිමි.

අයි. එම්. උදේනිකා මොහොට්ටි,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, පොල්පිතිගම.

2024 සැප්තැම්බර් මස 13 වැනි දින,
ප්‍රාදේශීය සභාව, පොල්පිතිගම.

09-217

---

## මහනුවර මහා නගර සභාව

1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ "අස්ගිරි ගෙඩිගේ රාජ මහා විහාර මාවත " නම් කිරීම

2024.02.29 වැනි දින පැවති කළමනාකරණ කමිටු රැස්වීමේ දී අංක 2024/1041 දරන තීරණය අනුව වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

02. 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1)අ වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "අස්ගිරි ගෙඩිගේ රාජ මහා විහාර මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්, මහනුවර.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
මහනුවර නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | මහනුවර මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | මහනුවර |
| 03. | වීථියේ වර්තමාන නම | : | ආදාහන මළුව පාර |
| 04. | අලුතින් යොදා ඇති නම | : | අස්ගිරි ගෙඩිගේ රාජ මහා විහාර මාවත |
| 05. | මාර්ග විස්තරය | : | මහනුවර නගර සීමාවේ පිහිටි ගෙඩිගේ රාජමහා විහාරය (ගාමිණී දිසානායක මාවත සම්බන්ධ වන ස්ථානය) අසලින් ආරම්භ වී දුම්රිය හරස් මාර්ගය (කටුගස්තොට මාර්ගයට පිවිසෙන ස්ථානය) අසලින් අවසන් වන මීටර් 997 ක තාර පාර |

09-196/1

## මහනුවර මහා නගර සභාව

### 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ ''අනිවත්ත ඇවනිව් (1) '' නම් කිරීම

2022.12.30 වැනි දින පැවති මහා සභා රැස්වීමේ දී අංක 8(90) දරන සභා සම්මුතියට අනුව වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

02. 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1)අ වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත ''අනිවත්ත ඇවනිව් (1)'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්, මහනුවර.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
මහනුවර නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | මහනුවර මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | මහනුවර |
| 03. | වීථියේ වර්තමාන නම | : | නැත |
| 04. | අලුතින් යොදා ඇති නම | : | අනිවත්ත ඇවනිව් (1) |
| 05. | මාර්ග විස්තරය | : | අනිවත්ත බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ජෝර්ජ් ඊ. ද සිල්වා මාවත අංක 167 කොඩිතුවක්කු ආරච්චි මහතාගේ නිවස අසල සිට අංක 171/10 නිවස දක්වා මාර්ගය |

09-196/2

---

## මහනුවර මහා නගර සභාව

### 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ ''අනිවත්ත ඇවනිව් (2) '' නම් කිරීම

2022.12.30 වැනි දින පැවති මහා සභා රැස්වීමේ දී අංක 8(90) දරන සභා සම්මුතියට අනුව වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

02. 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1)අ වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත ''අනිවත්ත ඇවනිව් (2)'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්, මහනුවර.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
මහනුවර නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : මහනුවර මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : මහනුවර |
| 03. | වීථියේ වර්තමාන නම | : නැත |
| 04. | අලුතින් යොදා ඇති නම | : අනිවත්ත ඇවනිව් (2) |
| 05. | මාර්ග විස්තරය | : අනිවත්ත බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ජෝර්ජ් ඊ ද සිල්වා මාවත අංක 139/7 සිට 139 A දක්වා මාර්ගය |

09-196/3

---

**මහනුවර මහා නගර සභාව**

1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ "නගර සභා සීමා මාර්ගය " (KMC Boundary Lane)" නම් කිරීම

2022.12.30 වැනි දින පැවති මහා සභා රැස්වීමේ දී අංක 8(88) දරන සභා සම්මුතියට අනුව වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

02. 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1)අ වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "නගර සභා සීමා මාර්ගය (KMC Boundary Lane)" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්, මහනුවර.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
මහනුවර නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : මහනුවර මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : මහනුවර |
| 03. | වීථියේ වර්තමාන නම | : නැත |
| 04. | අලුතින් යොදා ඇති නම | : නගර සභා සීමා මාර්ගය (KMC Boundary Lane) මාර්ගය |
| 05. | මාර්ග විස්තරය | : කටුගස්තොට කලුගල පාරේ නාගරික සීමාවේ වෙන්දේසි වත්තේ රිවිකිරණ මාවත වරිපනම් අංක 70/ඒ දරන ස්ථානයෙන් ආරම්භ වී අංක 70/ජී දක්වා දිවෙන මාවත |

09-196/4

## මහනුවර මහා නගර සභාව

### 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ ''එක්සත් මාවත'' නම් කිරීම

2022.12.30 වැනි දින පැවති මහා සභා රැස්වීමේ දී අංක 8(87) දරන සභා සම්මුතියට අනුව වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

02. 1989 අංක 12 පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2(1)අ වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත ''එක්සත් මාවත'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්, මහනුවර.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
මහනුවර නගර සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | මහනුවර මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | මහනුවර |
| 03. | වීථියේ වර්තමාන නම | : | නැත |
| 04. | අලුතින් යොදා ඇති නම | : | එක්සත් මාවත |
| 05. | මාර්ග විස්තරය | : | මහනුවර නගර සීමාවේ පිහිටි වීදිය බණ්ඩාර පටුමග දකුණට හැරෙන ස්ථානයෙන් ආරම්භ කරනු ලබන මාවත |

09-196/5

---

## මහනුවර මහා නගර සභාව

### 1975 අංක 04 දරන වීථි නම්කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ ''සංජීව හුලගමුව මාවත '' නම් කිරීම

2022.12.30 වැනි දින පැවති මහා සභා රැස්වීමේ දී අංක 8(89) දරන සභා සම්මුතියට අනුව වීථි නම් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

02. 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1)අ වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 71(1) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත ''සංජීව හුලගමුව මාවත '' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්, මහනුවර.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
මහනුවර නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 01. පළාත් පාලන ආයතනයේ නම | : | මහනුවර මහා නගර සභාව |
| 02. දිස්ත්‍රික්කය | : | මහනුවර |
| 03. වීථියේ වර්තමාන නම | : | නැත |
| 04. අලුතින් යොදාඇති නම | : | සංජීව හුලගමුව මාවත |
| 05. මාර්ග විස්තරය | : | මහනුවර මහා නගර සභාවේ පිහිටි සංජීව හුලංගමුව මහතාගේ නිවස ඉදිරිපිට ටෙලිකොම් කණුවේ අංක KA/0018/033 අසල සිට පෞරාණික ලිඳ අසල අතර මැද මාවත |

09-196/6

---

**මහව ප්‍රාදේශීය සභාව**

2025 අයවැය ඇස්තමේන්තුව මහජන නිරීක්ෂණය සඳහා අවස්ථාව සලසා දීම

මහව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයට අදාළ කෙටුම්පත් අයවැය ලෙඛනය 2024 ඔක්තෝබර් 01 වන දින සිට 2024 ඔක්තෝබර් 10 වන දින දක්වා (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ මහව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී මහජනතාවගේ නිරීක්ෂණය සඳහා තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10, 2(ආ) රීතිය ප්‍රකාරව ප්‍රදේශයේ මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජේ. එම්. ප්‍රියන්ත ජයසේකර,
ලේකම්,
මහව ප්‍රාදේශීය සභාව.

09-195

---

**කැලණිය ප්‍රාදේශීය සභාව**

අංක 262/ඒ මැවැල්ල ග්‍රාම සේවා වසමට අයත් අතුරු මාර්ග

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 262/ඒ මැවැල්ල ග්‍රාමසේවා වසමට අයත් ප්‍රදේශය තුළ පොදු මහජනතාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන, පහත සඳහන් අතුරු මාර්ග 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන ඡේදයේ 1 වැනි වගන්තිය යටතේ කැලණිය ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ප්‍රසිද්ධ කරන බව මෙයින් නිවේදනය කරමි.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව හෝ අදාළ ඉඩම් හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු, *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවේ නම් එකී මාර්ග ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවත්, පොදු ජනතාවගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරමි.

ඊ. එල්. සුහසිංහ,
ලේකම් හා සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභාව,
බුළුගහ හන්දිය, කැලණිය.

උපලේඛනය

**කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 262/ඒ මැවැල්ල ග්‍රාම සේවා වසමට අයත් මාර්ග විස්තරය**

| අනු. අංකය | අතුරු මාර්ග යේ නම | ආරම්භ වන ස්ථානය | අවසන් වන ස්ථානය | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | විස්තරය |
|---|---|---|---|---|---|---|
| 01. | මැවැල්ල පාර 1 පටුමග | වරිපනම් අංක 385 එන්. ඩී. අමරසිංහ | වරිපනම් අංක 385/1 එස්. තිලකසිරි | 28.6m | 3.05m-3.45m | කොන්ක්‍රීට් |
| 02. | මැවැල්ල පාර 2 පටුමග | වරිපනම අංක 460/1, යූ. පී. වීරසිංහ | වරිපනම් අංක 379/2, ඩබ්. පී. වී. ආර්. කුමාර | 46.6m | 3.7m-4.75m | ගල් ඇතුරූ |
| 03. | මැවැල්ල පාර 3 පටුමග | වරිපනම් අංක 304/1/1, කේ. එස්. දසනායක | වරිපනම් අංක 302/4 ඩබ්. එම්. පී. එම්. ජයවර්ධන | 67.2m | 3.35m - 4.9m | කොන්ක්‍රීට් |
| 04. | මැවැල්ල පාර 4 පටුමග | වරිපනම් අංක 302/1, එස්. පී. එස්. දසනායක | වරිපනම් අංක 298/6, එම්. එම්. ජේ. ජසින්තා | 106.8 m | 2.0m - 2.9m | 88.1m කොන්ක්‍රීට් සහ 18.7m ගල් ඇතුරූ |
| 05. | මැවැල්ල පාර 6 පටුමග | වරිපනම් අංක 270/1/1, කේ. ප්‍රේමලාල් | වරිපනම් අංක 266/4/ඒ, ආර්. ඒ. ඩී. පී. කුමාරි | 41.6m | 3.1m - 3.65m | කොන්ක්‍රීට් |
| 06. | මැවැල්ල පාර 7 පටුමග | වරිපනම් අංක 339 වී. සී. පෙරේරා | වරිපනම් අංක 339/4/ඒ, එච්. ඩබ්. සෝමචන්ද්‍ර | 54.9m | 3.15m-4.80m | ගල් ඇතුරූ |
| 07. | මැවැල්ල පාර 8 පටුමග | වරිපනම් අංක 244/9 මතකවීර | වරිපනම් අංක 250ඩී, ඩබ්. ප්‍රදීප් | 31.3m | 4.0m - 7.15m | බොරළු |
| 08. | මැවැල්ල පාර 9 පටුමග | වරිපනම් අංක 471/6, චන්ද්‍රානි ලියනගේ | වරිපනම් අංක 333/2, ඕ. ඩබ්. එස්. එම්. එම්. කිත්සිරි | 80.8m | 2.65m-3.35m | කොන්ක්‍රීට් |
| 09. | මැවැල්ල පාර 10 පටුමග | වරිපනම් අංක 325 එල්. දෙනගම | වරිපනම් අංක 325/6 එම්. ගුණවර්ධන | 81.5m | 4.5m - 5.6m | ගල් ඇතුරූ |
| 10. | මැවැල්ල පාර 11 පටුමග | වරිපනම් අංක 222/14, කේ. පී. පෙරේරා | වරිපනම් අංක 323/2/ඒ, එල්. ඩී. පෙරේරා | 48.7m | 1.8m-1.9m | ගල් ඇතුරූ |
| 11. | මැවැල්ල පාර 12 පටුමග | වරිපනම් අංක 311/313, පී. පී. බස්නායක | වරිපනම් අංක 313/1, යූ. එන්. කේ. ධර්මශීලි | 40.3m | 2.85m -3.65 | කොන්ක්‍රීට් |
| 12. | මැවැල්ල පාර 13 පටුමග | වරිපනම් අංක 250, ඩබ්. ටී. දසුනිකා | වරිපනම් අංක 244/2 පී. රණවීර | 62.3m | 2.85m-4.1m | ගල් ඇතුරූ |
| 13. | මැවැල්ල පාර 14 පටුමග | වරිපනම් අංක 307/15, එච්. ඩී. ජේ. පෙරේරා | වරිපනම් අංක 307/16, සී. විජේසිංහ | 108.7m | 2.85m-4.10m | ගල් ඇතුරූ |

09-213

# විවිධ දැන්වීම්

## මාතලේ ප්‍රාදේශීය සභාව

### 2024 වර්ෂය වෙනුවෙන් මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු සංශෝධනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මාතලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2023.12.15 දින අංක 2.363 IV(ආ) කොටසේ පළකර ප්‍රසිද්ධ කරන ලද මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා පැනවූ ගාස්තුව 2024 වර්යේ අගෝස්තු මස 22 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශය අනුව, 2024.09.01 වැනි දින සිට ගාස්තු සංශෝධනය කර නැවත අය කිරීම 2024.08.22 දිනැති මාගේ අංක 347 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලබන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවන තෙක් 2024.09.01 වැනි දින සිට ගාස්තු සංශෝධනය කර අය කරන බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. ටී. බී. හීන්කෙන්ද,
ලේකම්,
මාතලේ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 22 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2013.11.29 වැනි දින අනුමත අතුරු ව්‍යවස්ථා අංක 1838/55 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ ප්‍රකාශයට පත්කරන ලදුව මාතලේ ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ 3(අ) වන වගන්තිය අනුව මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂය වෙනුවන් මෘත දේහයක් ආදාහනය සඳහා පහත ගාස්තු පනවා පහත පරිදි අයකළ යුතු යැයි තීරණය කරමි.

***මෘත දේහයක් ආදාහනය සඳහා ගාස්තු :***

| | |
|---|---|
| මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා | රු. 20,000.00 |
| මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට පදිංචිකරුවන්ගේ මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා | රු. 22,500.00 |

09-192

---

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

### සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු අයකිරීම - 2024 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. එම්. නිරෝෂා හේරත් වන මම, එකී පනතේ විධිවිධාන ප්‍රකාරව සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.07.18 දිනැති ප්‍රතිපත්ති හා තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටු අංක 1453 දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. නිරෝෂා හේරත්,
ලේකම්,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 18 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව සතු ඉබ්බාගමුව දූයට කිරුළ සතිපොළ භූමිය කුලියට ලබාදීම සඳහා 2024 වර්ෂයේ අගෝස්තු මස 01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු ගාස්තු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

පහත සඳහන් ගාස්තුවලට අමතරව රජය විසින් පනවා ඇති බදු හෝ පැනවිය හැකි බදුවලට යටත් විය යුතුය.

**සේවා වර්ගය**

ඉබ්බාගමුව දූයට කිරුළ සතිපොළ භූමිය කුලියට ලබාදීම (පොළ නොපැවැත්වෙන දිනවල දී පමණි)

| | | *ගාස්තුව* *රු. ශත* |
|---|---|---|
| I. | සංදර්ශන සහ රැස්වීම් සඳහා දිනකට (විදුලිය සහ ජලය පහසුකම් සහිතව) | 15,000.00 |
| II. | ආපසු ලබාදෙන ආරක්ෂිත ඇප තැන්පත් මුදල | 10,000.00 |

09-194